# වාර්ෂික වාර්තාව

# 2016

## බුද්ධශාසන අරමුදල

අංක 135
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත
කොළඹ 07

දුරකථන - 0112303293
විද්‍යුත් තැපැල - bsfund@mbs.gov.lk
වෙබ් අඩවිය - www.mbs.gov.lk/si/com-akeeba/buddhasasana-fund

# පටුන


පිටු අංකය

**01. බුද්ධශාසන අරමුදල**

1.1 දැක්ම 1

1.2 මෙහෙවර 1

1.3 අරමුණු 1

1.4 කාර්යභාරයය 1

1.5 නෛතික රාමුව 2

**02. සංවිධාන ව්‍යුහය** 3

**03. කාර්ය මණ්ඩලය** 3

**04. කාර්ය සාධන ප්‍රගතිය**

4.1 සාමණේර ආයතන පවත්වානෙ යෑම සඳහා මූල්‍යාධාර ලබාදීම 4-5

4.2 සාමණේර ආයතන වර්ෂාවසාන පරීක්ෂණ පැවැත්වීම 6-7

4.3 දුෂ්කර විහරස්ථාන වල සනීපාරක්ෂක පහසුකම් සඳහා ආධාර ලබා දීම 7-8

4.4 සම්බුද්ධ ජයන්ති සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය 9

4.5 වැඩිහිටි වියේ පසුවන භික්ෂූන් වහන්සේලා සඳහා දඹදිව සිද්ධස්ථාන වන්දනා කර ගැනීමේ අවස්ථාව සලසා දීම 10

4.6 භික්ෂු වෛද්‍යාධාර වැඩසටහන 10-11

4.7 වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට ප්‍රායෝගිකව පුහුණුව ලබා දීම 12

4.8 උතුරු නැගෙනහිර පළාත් සඳහා ආධාර වැඩසටහන 13

**05. ඉදිරි ඉලක්ක** 13

**06. මූල්‍ය කළමණාකරණය**

6.1 ආදායම් වියදම් ගිණුම 14-15

6.2 ශේෂ පිරික්සුම 16-17

6.3 ශේෂ පත්‍රය 18

6.4 විගණකාධිපති වාර්තාව 19-24

# 01. බුද්ධශාසන අරමුදල

## 1.1 දැක්ම

බොදු පිළිවෙත් රකින, සාරධර්ම සපිරි ගුණගරුක දැහැමි සමාජයක් බිහිකිරීම.

## 1.2 මෙහෙවර

සම්බුදු ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාත්මික හා සාමාජීය සංවර්ධනයට දායක වෙමින්, විහාරස්ථානයන්හි ප්‍රත්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමෙන් බුද්ධශාසනයේ ස්ථිර පැවැත්ම වෙනුවෙන් කටයුතු සිදු කිරීම.

## 1.3 අරමුණු

I. බුද්ධශාසනය ආරක්ෂා කිරීම සඳහා සුදුසු වැඩ සටහන් සිදු කිරීම.
II. බුද්ධශාසනය පෝෂණය කිරීම සඳහා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

## 1.4 අරමුදලේ කාර්යභාරය

1. සාමණේරයන් වහන්සේලා 5 නමකට වඩා සාමණේර අධ්‍යාපනය ලබා දෙන සාමණේර ආයතන සඳහා මාසික මූල්‍යාධාර පිරිනැමීම.

2. සාමණේර ආයතනවල සාමණේරයන් වහන්සේලාගේ දහම් දැනුම හා වත් පිළිවෙත් පිළිබඳ වාර්ෂික ඇගයීම.

3. දිවයින පුරා අඩු පහසුකම් සහිත විහාරස්ථානයන්හි භෞතික අවශ්‍යතා සපුරාලීම.

4. සම්බුද්ධත්ව ජයන්ති සාමණේර කැපකරු යෝජනා ක්‍රමය

5. දඹදිව සිද්ධස්ථාන වන්දනාවේ නොයෙදුනු වැඩිහිටි වියේ පසුවන භික්ෂූන් වහන්සේලා සඳහා එම සිද්ධස්ථාන වන්දනා කරගැනීමේ අවස්ථාව සලසා දීම

6. භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.


7. වැඩිහිටි වියේදී පැවිදි බිමට ඇතුළත්වූ සහ තරුණ ස්වාමීන්වහන්සේලා සඳහා පැවිදි ප්‍රතිපදාවට අයත් වත්පිළිවෙත්, දහම් දැනුම ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම

8. උතුරු නැගෙනහිර පළාත්වල විහාරස්ථාන/ ආරාමයන්හි මූලික පහසුකම් වැඩිදියුණු කිරීම.

## 1.5 අරමුදල පිහිටා ඇති නෛතික රාමුව


"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය වන්නේ "ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය". එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙහි හා 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියළුම ආගම් වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය" යන්න දැක්වේ.

එකී කාර්යභාරයට අනුව 1990 අංක 35 දරණ පනතකින් බුද්ධශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම සඳහා අරමුදල් එකතු කිරීම හා සම්පාදනය කිරීම සඳහා බුද්ධශාසන අරමුදල ලෙස මෙම අරමුදල පිහිටුවා ඇති අතර බුද්ධශාසනය ආරක්ෂා කිරීමෙහි සහ පෝෂණය කිරීමෙහි නිරතව සිටින ආයතන කළමණාකරණයෙහිලා සහාය වීමද අරමුදලේ කාර්ය කරගෙන යාමට අනුශාංගික වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියාවන් සහ දේවල් කිරීම සඳහා බුද්ධශාසන අරමුදල කටයුතු කළයුතු වන බව එම පනතින් නියම කර ඇත.


ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1990 අංක 35 දරන
බුද්ධ ශාසන අරමුදල පනත

## 02. සංවිධාන ව්‍යුහය




## 03. කාර්යය මණ්ඩලය

1990 අංක 35 දරණ බුද්ධශාසන අරමුදල් පනතේ 7 (ඊ) හා 14 වැනි වගන්ති යටතේ පාලක මණ්ඩලය විසින් පනවනු ලබන නීතිවල සඳහන් පරිදි අරමුදලේ ප්‍රධාන විධායකයා ලෙස පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන ලේකම් වරයෙකු සිටිය යුතු අතර එම ලේකම්වරයා ගණන් දීමේ නිලධාරියාද වන අතර හැකි සෑම විටම බුද්ධශාසන අමාත්‍යාංශයට අනුයුක්ත රජයේ මාණ්ඩලික නිලධාරීයෙකු අතරින් පත් කරගත යුතු බව දක්වා ඇත.

මේ අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු තම නිත්‍ය රාජකාරියට අමතරව මෙම ලේකම් තනතුරේ වැඩ බැලීම සිදු කරනු ලැබේ. එමෙන්ම විශ්‍රාමික ගණකාධිකාරීවරියක අරමුදලේ ගණකාධිකාරී ලෙස සේවය කරනු ලැබේ.

# 04. කාර්ය සාධන ප්‍රගතිය.

## 4.1 සාමණේර ආයතන පවත්වාගෙන යාම සඳහා මූල්‍යාධාර ලබාදීම

ගිහි ජීවිතය අතහැර පැවිදි ජීවිතයට ඇතුලත් වන දරුවා කෙටි කාලයකින් පිරිවෙන් අධ්‍යාපනය වෙත යොමු කෙරේ. අතීතයේ පැවති ක්‍රමය වූයේ කුල දරුවෙකු වසර දෙක තුනක් විහාරස්ථානයක සිටිමින් පැවිදි ජීවිතය හා බණ දහම් පිළිබඳ අවබෝධය ලබා ගනිමින් සිය කැමැත්තෙන්ම පැවිදි ජීවිතයට ඇතුළු වීමයි. නමුත් වර්තමානයේ පැවිදි ජීවිතයට ප්‍රවේශ වන කුල දරුවන්ට සසුන්ගත වීමට පෙර පැවිදි ජීවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඇති අවස්ථා අඩුය.


මෙම අවශ්‍යතාවය අවබෝධ කර ගනිමින් බුද්ධශාසන අරමුදල පිහිටු වීමෙන් පසු ආරම්භ කළ ඵලදායී ව්‍යාපෘතියක් ලෙස මෙම සාමණේර අධ්‍යාපන වැඩසටහන හඳුනාගත හැකිවේ. කුඩා සාමණේර හිමිවරුන්ට භික්ෂුත්වය පිළිබඳ ඇල්මක් ඇති කිරීම, භික්ෂු ජීවිතය පිළිබඳ යහපත් ආකල්ප ගොඩනැගීම සහ වත් පිළිවෙත් පිළිබඳ දැනුමෙන් සරු භික්ෂූන් වහන්සේ නමක් බිහි කිරීම සාමණේර ආයතනයක අරමුණ වී තිබේ. දසධම්ම සූත්‍රයෙන් නිරූපිත සම්පූර්ණ භික්ෂූන් වහන්සේ නමක් සමාජයට දායාද කිරීම, භික්ෂු ජීවිතය බෞද්ධ පිළිවෙත් අනුව සකස් වූ ජීවිතයක් බව අවබෝධ කර දීම, භික්ෂූන් වහන්සේ හා ගිහියා අතර වෙනස හා භික්ෂුත්වයේ උත්තරීතර භාවය අවබෝධ කරවීම, වෙනත් කෙනෙකුට බරක් නොවී භික්ෂු ජීවිතය ගත කළ යුතු ආකාරය උගැන්වීම සාමණේර අධ්‍යාපනයෙන් සිදු කරනු ලැබේ.

<u>ආධාර ලැබීමට තිබිය යුතු අවශ්‍යතා</u>

i. දහම් පාසල හැරුණු විට වෙනත් අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන නොයන ලබන විහාරස්ථානයක් විය යුතුය.
ii. තුන් බෝධිය තිබිය යුතුය.
iii. අධ්‍යාපනය ලබන සාමණේර හිමිවරුන් නේවාසිකව වැඩ විසිය යුතුය.
iv. නේවාසිකව වැඩ විසීම සඳහා අවශ්‍ය ලැගුම් ගෙවල්, ජලය, විදුලිය, වැසිකිළි ආදි මූලික අවශ්‍යතා තිබිය යුතුය.
v. උදෑසන හා දවල් දානය ප්‍රමාණවත් පරිදි ලැබෙන දායක පිරිස් සහිත විහාරස්ථානයක් විය යුතුය.
vi. කුඩා සාමණේර හිමිවරුන් පුහුණු කරවීමට උගත්, සිල්වත් උපසපන් උපාධ්‍යායන් වහන්සේ නමක් සිටිය යුතුය.

## 2016 වසරේ මූල්‍යාධාර ලබා දුන් ආයතන

| අනු අංකය | ආයතනය (නම/ලිපිනය) | ආයතනයේ සිටින සාමණේර හිමිවරු ගණන |
|---|---|---|
| 01 | පල්ලේපොල ශ්‍රී සාරිපුත්ත සාමණේර ආයතනය | 05 |
| 02 | මිහිඳු සාමණේර ආයතනය | 12 |
| 03 | ගුන්නැපාන ශ්‍රී ධම්මපාල සාමණේර ආයතනය | 06 |
| 04 | ගාල්ල සිරිසුදස්සී සාමණේර ආයතනය | 19 |
| 05 | ගාල්ල විද්‍යාදීප සාමණේර ආයතනය | 05 |
| 06 | අමුණුගොඩ සිරිපැරකුම් සාමණේර ආයතනය | 05 |
| 07 | මහනුවර සිරි ධම්මරතන සාමණේර ආයතනය | 12 |
| 08 | ඇඹුල්පුර සම්බුද්ධාලෝක සාමණේර ආයතනය | 09 |
| 09 | දඹුල්ල ජිනරතන සාමණේර ආයතනය | 10 |
| 10 | විද්‍යාවංශ සාමණේර ආයතනය | 11 |
| 11 | කළුතර ඉන්ද්‍රජෝති සාමණේර ආයතනය | 05 |
| 12 | මහා මහින්ද සාමණේර ආයතනය | 06 |
| 13 | කටුගස්තොට සුධම්මානන්ද සාමණේර ආයතනය | 19 |
| 14 | තංගල්ල සිරි අරියවංශ සාමණේර ආයතනය | 11 |
| | එකතුව | 135 |







## 4.2 සාමණේර ආයතන වර්ෂාවසාන පරීක්ෂණ පැවැත්වීමේ වැඩසටහන

බුද්ධශාසන අරමුදල පිහිටු වීමෙන් පසු ආරම්භ කළ ඵලදායී ව්‍යාපෘතියක් ලෙස මෙම සාමණේර අධ්‍යාපන වැඩසටහන පැහැදිලිව හඳුනාගත හැකි වේ. කුඩා සාමණේර හිමිවරුන්ට භික්ෂුත්වය පිළිබඳ ඇල්මක් ඇති කිරීම, භික්ෂූන් වහන්සේගේ ජීවිතය පිළිබඳව යහපත් ආකල්ප ගොඩනැගීම සහ වත්පිළිවෙත් පිළිබඳ දැනුමෙන් සරු භික්ෂූන් වහන්සේ නමක් බිහි කිරීම සාමණේර ආයතනයක අරමුණ වේ.

මෙකී අරමුණු ඔස්සේ පුරුදු පුහුණු වූ සාමණේර හිමිවරුන්ගේ දැනුම හා ආකල්ප පිළිබඳ පරීක්ෂා කර බැලීමක් මෙහිදී  සිදු කෙරේ. ඒ අනුව පුහුණුව ප්‍රමාණවත්ව ලැබීමෙන් පසු සෑම වසරක් අවසානයේ දී බුද්ධශාසන අරමුදල විසින් පවත්වනු ලබන වර්ෂ අවසාන විභාගයට සාමණේර භික්ෂූන් වහන්සේලාට පෙනී සිටිය හැකි වේ. මෙම ඇගයීමේ දී ලිඛිත පරීක්ෂණයක් මෙන්ම ප්‍රායෝගික හැකියාව පිළිබඳව පරීක්ෂණයක් ද නායක ස්වාමීන්වහන්සේලා ගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදු කෙරේ. මෙම පරීක්ෂණයෙන් විශිෂ්ඨ හා අධිශ්‍රේණියේ සාමාර්ථ ලබා ගන්නා සාමණේරයන් වහන්සේලාට විශේෂ ඇගයීමක් බුද්ධශාසන අරමුදල මඟින් සිදු කෙරේ.


**ක්‍රියාත්මක ක්‍රමවේදය**

i. ලියාපදිංචි කර ඇති සාමණේර ආයතන වලින් විභාගය සඳහා අයදුම් පත්‍ර කැඳවීම
ii. විභාග කටයුතු සංවිධානය කිරීම
iii. විභාගය පැවැත්වීම
iv. ශිෂ්‍යත්ව ලබා දීම





## 2016 වර්ෂයට අදාළව පවත්වන ලද පරීක්ෂණය පිළිබඳ තොරතුරු

| | |
|---|---|
| ❖ පරීක්ෂණය පැවැත්වූ ස්ථානය | කැළණිය,පැලියගොඩ, විද්‍යාලංකාර පිරිවෙන |
| ❖ පැවැත්වූ දිනය හා වේලාව | 2017.01. 28 (පෙ.ව 9.00 - ප.ව 3.00) |
| ❖ පරීක්ෂණයට පෙනී සිටි ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව | 54 |
| ❖ වැය කළ මුදල | රු103,720/= |



ලිඛිත පරීක්ෂණය




වාචික පරීක්ෂණය

## 4.3 දුෂ්කර විහාරස්ථාන වල සනීපාරක්ෂක පහසුකම් සඳහා ආධාර ලබා දීම

දිවයින පුරා පිහිටි විහාරස්ථාන අතුරින් මූලික පහසුකම් සම්පූර්ණ නොවූ විහාරස්ථාන රාශියක් දැකිය හැකිය. එබැවින් අවම පහසුකම් සම්පූර්ණ නොවූ එම විහාරස්ථානවල වැඩ වසන භික්ෂූන් වහන්සේලාට සනීපාරක්ෂක හා වෙනත් පහසුකම් දියුණු කර ගැනීම සඳහා අවස්ථාව සලසාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

වර්ෂයකට එක් දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තෝරාගෙන එම බල ප්‍රදේශය සම්බන්ධව ප්‍රමුඛතා ලේඛනය අනුව සැකසූ වාර්තාවක් අනුව විහාරස්ථාන තෝරාගැනීම හා සෘජුව බුද්ධශාසන අරමුදල වෙත කෙරෙන ඉල්ලීම් ද ප්‍රාදේශීය ලේකම්/ බෞද්ධ කටයුතු සමායෝජකගේ නිර්දේශය සහිතව ලබාගෙන පාලක මණ්ඩල අනුමැතියෙන් මූල්‍යාධාර ලබාදීම සිදු කෙරේ.





**2016 වර්ෂයේ දී සනීපාරක්ෂක පහසුකම් සඳහා මූල්‍යාධාර ලබා දුන් විහාරස්ථාන**

| අනු අංකය | විහාරස්ථානයේ නම | ලිපිනය | ලබා දුන් මුදල |
|---|---|---|---|
| 1 | ශ්‍රී වර්ධනාරාමය | වදවලකන්ද, කොබෝනීල්ල | 100,000 |
| 2 | පුරාණ ගල්ලෙන් විහාරය | උඩවෙල, කහටලියද්ද | 100,000 |
| 3 | ශ්‍රී බෙත්තාරාම විහාරය | තලගුණේ, උඩුදුම්බර | 100,000 |
| 4 | ශ්‍රී රත්නාලෝක විහාරය | ආඩිදෙණිය, කහටලියද්ද | 100,000 |
| 5 | ශ්‍රී ඉසිපතනාරාම විහාරය | හාල්යාල, උඩුදුම්බර | 100,000 |
| 6 | ශ්‍රී සුදර්ශනාරාම විහාරය | හපුකන්ද, බෝපාන | 100,000 |
| 7 | ශ්‍රී දළදාගමන් විහාරය | කෙවුල්ගම, හුන්නස්ගිරිය | 100,000 |
| 8 | ශ්‍රී අභිනවාරාමය | ඔයතැන්න,පෝප්පිටිය | 100,000 |
| 9 | ශ්‍රී ධර්මාරාමය | මහවල, උඩුවාහින්න | 100,000 |
| 10 | ශ්‍රී දේවගිරි විහාරය | දේවහන්දිය | 100,000 |
| 11 | ශ්‍රී සුමංගලාරාමය | මිනුවන්ගමුව, බෝපාන | 100,000 |
| 12 | ශ්‍රී ධර්මචක්‍ර විහාරය | පදුපොල, කළුගල | 100,000 |
| 13 | ශ්‍රී පුෂ්පාරාමය | කළුගල | 100,000 |
| 14 | ශ්‍රී ආශ්‍රමික බෞද්ධ මධ්‍යස්ථානය | 5 කණුව, කහටලියද්ද | 100,000 |
| 15 | ශ්‍රී ජයදම්වෙහෙර බෞද්ධ මධ්‍යස්ථානය | කලවල, මඩුගල්ල | 100,000 |
| 16 | ශ්‍රී සුමනාරාමය | බෝපාන, කළුන්තැන්න | 100,000 |
| 17 | ශ්‍රී විජිතාරාමය | මඩුගල්ල උඩගම්මැද්ද, මඩුගල්ල | 100,000 |
| 18 | ශ්‍රී ගංගාරාමය | කයිකාවල, මීමුරේ | 100,000 |
| 19 | ශ්‍රී බෝධිමළු විහාරය | පිටවල, බෝපාන | 100,000 |
| 20 | ශ්‍රීසුමිත්‍රාරාම විහාරස්ථානය | අළුගොල්ල, හේවාදිවල | 100,000 |
| 21 | මිහිඳු ධර්ම විජය භාවනා මධ්‍යස්ථානය | විජයශ්‍රීගම , දිගන | 100,000 |
| | මුළු මුදල | | 2,100,000 |

## 4.4 සම්බුද්ධ ජයන්ති සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය

සම්බුද්ධත්ව ජයන්ති වර්ෂයට අදාළව හා 2010 වර්ෂයේ සිට පැවිදි වූ සාමණේර හිමිවරුන් සඳහා විශේෂ සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමයක් හා 2014 වර්ෂයේ සැප්තැම්බර් මාසයෙන් පසු පැවිදි වූ සාමණේර හිමිවරුන් සඳහාද මෙම ව්‍යාපෘතිය අදාළ වේ. මෙම ව්‍යාපෘතිය මඟින් ඉහත කාලය තුළ පැවිදි බිමට පත් සාමණේරයන් වහන්සේලාගේ අධ්‍යාපන කටයුතු සඳහා හෝ වෙනත් ප්‍රත්‍ය අවශ්‍යතා සඳහා මූල්‍යමය දායකත්වයක් ලබා දීම තුළින් උන්වහන්සේලාගේ ශාසන පැවැත්මට සහයක් ලබාදීම අපේක්ෂා කෙරේ. මෙම සාමණේර ශිෂ්‍යාධාර කැපකරු ක්‍රමයට තෝරාගනු ලබන්නේ පහත සඳහන් සුදුසුකම් ඇති සාමණේර හිමිවරුන්ය.

i. 2010 ජනවාරි 01 දින සිට 2013 වෙසක් සතියෙහි අවසාන දිනය දක්වාවූ කාලය තුළ පැවිදි කළ සාමණේර හිමිනමක් විය යුතුය.

ii. පැවිදි වන දිනට වයස අවුරුදු 18 ට අඩු විය යුතුය.

iii. පැවිදි වී මාස 3 ක් ගත වී තිබිය යුතුය.

iv. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ සාමණේර ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

v. එක් විහාරස්ථානයකින් උපරිම දස නමකි.

vi. 2014 සැප්තැම්බර් මාසයෙන් පසු පැවිදි වූ සියලු භික්ෂූන් වහන්සේලා මෙම ශිෂ්‍යාධාර ක්‍රමයට දායක කර ගැනීමට අපේක්ෂා කෙරේ.

සාමණේර ස්වාමීන් වහන්සේලා සඳහා වන සාමණේර කැපකරු ශිෂ්‍යාධාර යටතේ 2016 ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා මසකට රු 500 බැගින් ගෙවා ඇති අතර 2016 /08/ 10 වැනි දින පවත්වන ලද 76 වැනි පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි 2016 සැප්තැම්බර් මස සිට සාමණේර ස්වාමීන් වහන්සේලා සඳහා මසකට රු 700 බැගින් වන මුදලක් ගෙවීමට කටයුතු කර ඇත.

මෙම වසරේ ජනවාරි මස සාමණේර කැපකරු ශිෂ්‍යාධාර ගෙවීම් යටතේ සාමණේර ස්වාමීන් වහන්සේලා 613 නමකටද සැප්තැම්බර් මස සිට 663 නමක් වෙනුවෙන්ද මාසික දීමනා ගෙවා ඇත. මේ අනුව මෙම වසරේදී ලබා දී ඇති මුදල 4,454,026.50/= කි. මෙම ව්‍යාපෘතිය සඳහා ගෙවීම් තැපැල් කාර්යාල හරහා සිදු කෙරෙන බැවින් මෙම මුදලට තැපැල් කාර්යාල සඳහා වන කොමිස් මුදලක් ද ඇතුළත් වී ඇත.

## 4.5 වැඩිහිටි වියේ පසුවන භික්ෂූන් වහන්සේලා සඳහා දඹදිව සිද්ධස්ථාන වන්දනා කර ගැනීමේ අවස්ථාව සලසා දීමේ වැඩසටහන

දඹදිව සිද්ධස්ථාන වන්දනාවේ නොයෙදුණු වැඩිහිටි වියේ පසුවන භික්ෂූන් වහන්සේලා සඳහා මෙම සිද්ධස්ථාන වන්දනා කර ගැනීමේ අවස්ථාව සලසා දීම සඳහා ආධාර වැඩසටහනක් ලෙස මෙය පැවැත්වීමට සැලසුම් කර තිබුණද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ගැටලු සහගත තත්වයක් පැවතුන බැවින් මෙය අවලංගු කිරීමට පාලක මණ්ඩලය තීරණය කර ඇත.

## 4.6 භික්ෂු වෛද්‍යාධාර වැඩසටහන

ශ්‍රී ලංකාව පුරා වැඩ සිටින භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර ක්‍රමයක් ලෙස මෙය ක්‍රියාත්මක කෙරේ. 2559 වෙනි වෛශාඛ්‍ය මංගල්‍ය නිමිති කොටගෙන දිවයින පුරා වැඩ සිටින අඛණ්ඩව වෛද්‍ය ප්‍රතිකාර ලබන භික්ෂූන් වහන්සේලාට වෛද්‍ය පහසුකම් සඳහා ආධාර ලබා දීම මෙයට අදාළ වේ.

මෙහිදී දිවයින පුරා වැඩසිටින සුදුසුකම් ලත් භික්ෂූන් වහන්සේලා අතුරින් ප්‍රාදේශීය ලේකම් හා ශාසනාරකෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී හිමියන්ගේ නිර්දේශයන්ද වෛද්‍ය නිර්දේශයන්ද මත භික්ෂූන් වහන්සේලා වෙත වෛද්‍යාධාර ලෙස මසකට රු. 5000/= ක මුදලක් ගෙවීම සිදුවේ.

2016 ආරම්භ වන විට එක් ස්වාමීන් වහන්සේ නමක් සඳහා පමණක් ලබාදී තිබූ භික්ෂු වෛද්‍යාධාර දීමනාව 2016 අගෝස්තු මස වන විට ස්වාමීන්වහන්සේලා 7 නමක් දක්වා වැඩි වී ඇති අතර ඊට අමතරව පූජ්‍ය කුරුණෑගල උපනන්ද ස්වාමීන් වහන්සේට MRI වෛද්‍ය පරීක්ෂණයක් සඳහාද ආධාර ලබා දී ඇත.





**2016 වර්ෂයේදී ගෙවීම් කරන ලද වෛද්‍යාධාර පිළිබඳ තොරතුරු.**

| අනු අංකය | ස්වාමීන් වහන්සේ නම | රෝගය | 2016 වර්ෂයේ ගෙවීම් ආරම්භ කළ මාසය | ලබා දුන් වාර්ෂික මුදල |
|---|---|---|---|---|
| 1 | පූජ්‍ය ආදාඋල්පත බුද්ධසාර හිමි | අරන්තලාව භික්ෂු ඝාතනයෙන් ආබාධිත වී ඇත. | ජනවාරි | 60,000 |
| 2 | පූජ්‍ය වැලිගමුවේ සුසීම හිමි (රඹුක්කන,කොස්හින්න, නාගවනාරාමය) | අධිරුධිර පීඩනය, ඇදුම | ජනවාරි | 60,000 |
| 3 | පූජ්‍ය වල්ගොව්වාගොඩ ශ්‍රී මේධංකර විමලබුද්ධි හිමි (මහනුවර මල්වතු මහා විහාරයේ වල්ගොව්වාගොඩ විහාරස්ථානය) | අංශභාගය | අගෝස්තු | 25,000 |
| 4 | පූජ්‍ය පිලානේ ජයශාන්ත හිමි (දෙණියාය කිරිවැල්කඳුල, දෙහිගම්පල සිරි සෝරතාරාම විහාරස්ථානය) | ස්නායු දුර්වලතාවය | අගෝස්තු | 25,000 |
| 5 | පූජ්‍ය බිහල්පොල නාරද හිමි (මඩවලතැන්න, උහුමීය භාවනා මධ්‍යස්ථානය) | වකුගඩුවක් හා අක්මාවේ කොටසක් දන් දී ඇති බැවින් ජීවිතාන්තය දක්වා වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වී ඇත. | අගෝස්තු | 25,000 |
| 6 | පූජ්‍ය දොඩම්ගොල්ලේගම පුඤ්ඤරතන හිමි (සුධර්මාරාම ටැම්පිට විහාරය, මුවපිටිය, රඹුක්කන) | අංශභාගය | අගෝස්තු | 25,000 |
| 7 | පූජ්‍ය අත්තිඩියේ ශ්‍රී විජිතසිරි හිමි (මහනුවර අස්ගිරිය , මහයියාව ශ්‍රී අශෝකාරාම විහාරස්ථානය) | ශරීරයේ ඉණෙන් පහළ ප්‍රදේශය පණ නැති රෝගයකින් පෙළීම) | අගෝස්තු | 25,000 |
| 8 | පූජ්‍ය කුරුණෑගල උපනන්ද හිමි | MRIවෛද්‍ය පරීක්ෂණයක් | අගෝස්තු | 15,800 |
| | මුළු මුදල | | | 260,800 |


## 4.7 වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට ප්‍රායෝගිකව පුහුණුව ලබා දීම

වයස්ගතව පැවිදි ජීවිතයට ඇතුලත්වන ස්වාමීන්වහන්සේලා වැඩි වෙමින් පවතින ප්‍රවනතාවයක් තුළ එවැනි හිමිවරු පැවිදි ජීවිතය පිළිබඳව මනා අවබෝධයකින් තොරව හැසිරෙන බැවින් එම තත්වය බෞද්ධ සැදැහැවතුන්ගේ කලකිරීමටත් විවේචනයටත් භාජනය වූ අවස්ථා තිබේ. එසේම ශාසනයට අහිතකර බොහෝ දෑ කිරීමට පෙළඹීම නිසා සමාජ දෝෂ දර්ශනයට ලක්වන අවස්ථා දැකිය හැකි වේ. මේ අනුව එවැනි හිමිවරුන්ට පැවිදි ජීවිතයේ ඇති උත්තරීතර භාවය හා ගිහි පැවිදි වෙනස පිළිබඳව මා මූලික වත් පිළිවෙත් හා ධර්මානුකූල දැනුමක් ද ලබාදීමට මෙම වැඩමුළු පැවැත්වේ.

දිස්ත්‍රික් ලේකම් හරහා ප්‍රාදේශීය ලේකම් මඟින් අදාල බල ප්‍රදේශයේ විහාරස්ථානවල වැඩ සිටින ළමාවිය ඉක්මවා පැවිදි වූ භික්ෂූන් වහන්සේලාගේ තොරතුරු කැඳවා ගනු ලබයි. ලැබෙන තොරතුරු මත තෙදින වැඩසටහන් පැවැත්වීම අපේක්ෂා කරනු ලැබේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන්ගේ සහය ලබාගෙන උක්ත වැඩසටහන අදාල දිස්ත්‍රික්කය තුළදී සංවිධානය කරනු ලබන අතර, එක් වැඩසටහනත් සඳහා අවම භික්ෂූන් වහන්සේලා 10 නමක් අපේක්ෂා කෙරේ.

### 2016 වර්ෂයේ පැවැත්වූ වැඩසටහන් පිළිබඳ විස්තර

| දිස්ත්‍රික්කය | අනුරාධපුර |
|---|---|
| ස්ථානය | ගල්නෑව ශ්‍රී ගංගාරාම පිරිවෙන් විහාරස්ථානය |
| සම්බණ්ධීකරණය | පූජ්‍ය කරකොලේ පියදස්සී නාහිමි |
| මෙහෙයවීම | පූජ්‍ය ලක්ෂහේනේ ඥානානන්ද හිමි |
| දින ගණන | 03 |
| සහභාගී වූ හිමිවරු සංඛ්‍යාව | 10 |
| මෙම වැඩසටහන සඳහා වැය වූ මුදල | රු.341,139/- |





## 4.8 උතුරු නැගෙනහිර පළාත් සඳහා ආධාර වැඩසටහන

දමිල බෞද්ධ දරුවන්ගේ දහම් දැනුම වර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ වන අතර 2016 වර්ෂයේදී මේ යටතේ යාපනයේ නන්දාරාම දමිළ බෞද්ධ දහම් පාසැල පවත්වාගෙන යාම වෙනුවෙන් යාපනයේ චුන්නාගම් දමිළ බෞද්ධ සංගමය වෙත රු 138,000 ක ආධාර මුදලක් ලබාදී ඇත.

# 05. ඉදිරි ඉලක්ක

### 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

| අනු අංකය | වැඩසටහන | වාර්ෂික ඉලක්ක |
|---|---|---|
| 1. | දිවයිනේ අඩු පහසුකම් සහිත විහාරස්ථාන සඳහා කැපකරු දායක ක්‍රමයක් ක්‍රියාත්මක කිරිම | කැපකරු ආයතන වශයෙන් ආයතන 20ක් හඳුනා ගනිමින් මූල්‍යාධාර ලබාදීම |
| 2. | සම්බුද්ධත්ව ජයන්ති කැපකරු ශිෂ්‍යාධාර යෝජනා ක්‍රමය | සාමණේර හිමිවරුන් 700 නමකට ශිෂ්‍යාධාර ලබාදීම |
| 3. | දිවයින පුරා වැඩසිටින භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර ලබාදීම | දිවයින පුරා වැඩසිටින සුදුසුකම්ලත් භික්ෂූන් වහන්සේලාගෙන් ප්‍රාදේශිය ලේකම් හා ශාසනාරක්ෂක මණ්ඩලයේ ලේඛකාධිකාරී හිමියන්ගේ නිර්දේශයෙන් හා වෛද්‍ය නිර්දේශය මත භික්ෂූන් වහන්සේලා වැඩි සංඛ්‍යාවක් වෙත වෛද්‍යාධාර ලබාදීම. |
| 4 | වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලා සඳහා පැවිදි ජීවිතය සම්බන්ධව ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම | වැඩසටහන් සංඛ්‍යාව 4 කි. |
| 5 | දිවයින පුරා පිහිටි දුෂ්කර විහාරස්ථාන සඳහා සනීපාරක්ෂක පහසුකම් වෙනුවෙන් ආධාර ලබාදීම | තෝරාගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් ප්‍රාදේශීය ලේකම් නිර්දේශය සහිතව සනීපාරක්ෂක පහසුකම් ලබා දීම පිළිබඳ වාර්තාවක් ලබාගෙන එම වාර්තාවට අනුව විහාරස්ථාන 50 ක් සඳහා මූල්‍යාධාර ලබා දීම. |
| 6. | දිවයින පුරා පිහිටා ඇති දුෂ්කර විහාරස්ථාන සඳහා සංඝාවාස ඉදි කිරීමේ ව්‍යාපෘතිය | දුෂ්කර දිස්ත්‍රික්කවලින් ප්‍රාදේශිය ලේකම් හා ශාසනාරක්ෂක මණ්ඩලයේ ලේඛකාධිකාරී හිමියන්ගේනිර්දේශ සහිතව වඩාත් සුදුසුම විහාරස්ථාන 10 ක් තෝරාගෙන සංඝාවාස 10 ක් ඉදිකිරීම |

# 06. මූල්‍ය කළමණාකරණය

බුද්ධශාසන අරමුදල

2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## 6.1 ආදායම් වියදම් ගිණුම

| | සටහන | 2016 | 2015 |
|---|---|---|---|
| | | රු. ශ | රු. ශ |
| **ආදායම** | | | |
| ආයෝජන ආදායම | 5 | 34,748,961.49 | 34,011,621.29 |
| ධර්ම ග්‍රන්ථ අලෙවියෙන් ලාභ | 6 | 214,798.62 | 231,376.67 |
| පරිත්‍යාග සහ වෙනත් ආදායම් | 4 | 74,675.57 | 160,624.84 |
| **මුළු ආදායම් එකතුව** | | 35,038,435.68 | 34,403,622.80 |
| **[illegible]කළා : ව්‍යාපෘති වියදම** | | | |
| සාමණේර ආයතන ආධාර | | 1,015,000.00 | 1,632,500.00 |
| සාමණේර ආයතන - අධීක්ෂණ වියදම් | | 14,245.00 | 23,075.00 |
| සාමණේර කැපකරු දායක වාරික මුදල් | | 4,454,026.50 | 2,572,900.00 |
| භික්ෂු වෛද්‍යාධාර | | 260,800.00 | |
| සනීපාරක්ෂක කටයුතු සඳහා මූල්‍යාධාර | | 2,100,000.00 | |
| උඩුදුම්බර චෙක්පත් බෙදාදීම වියදම් | | 138,000.00 | |
| දානමය පිරිකර සඳහා ග්‍රන්ථ පරිත්‍යාග | | - | 235,099.90 |
| සාමණේර ආයතන විභාග | | 8,350.00 | 385,370.00 |
| වැඩිහිටි භික්ෂු ආකල්ප ප්‍රවර්ධන වැඩසටහනට වියදම් | | 341,139.00 | 226,998.00 |
| **පරිපාලන වියදම්** | | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | | 24,866.00 | 15,332.00 |
| පාලක මණ්ඩල පාරිශ්‍රමික දීමනා හා කාර්ය මණ්ඩල වැ | | 342,032.27 | 856,722.20 |
| ගමන් වියදම් | | 52,082.00 | 51,843.00 |
| පරිගණක පුහුණු දීමනා | | 218,000.00 | 238,000.00 |
| උපයන විට ගෙවූ බදු | | - | 15,550.09 |
| අතිකාල | | 14,694.00 | |
| සංග්‍රහ වියදම් | | 15,980.00 | 26,845.00 |
| වියදම් | | 67,566.00 | 58,200.00 |
| **විවිධ ක්‍ෂය වෙන්කිරීම්** | | | |
| සේප්පුව | | 4,310.00 | 4,310.00 |
| ගොඩනැගිලි ඉදිකිරීම් | | 87,500.00 | 87,500.00 |
| ලී බඩු උපකරණ ක්‍ෂය | | 5,775.00 | 5,775.00 |
| ශබ්ද විකාශන යන්ත්‍රය | | 5,735.00 | 5,735.00 |
| උපකරණ සහ සවි කිරීම් | | 16,294.00 | 16,294.00 |

| | | |
|---|---|---|
| වියදම්වල එකතුව | 9,186,394.77 | 6,458,049.19 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(ඌණතාවය) | 25,852,040.91 | 27,945,573.61 |

# බුද්ධශාසන අරමුදල

## 6.2 - 2016-12-31 දිනට ශේෂ පිරික්සුම

| | | හර | බැර |
|---|---|---|---|
| | | රු ශ | රු ශ |
| ස්ප්පුව | | 57,456.00 | |
| ාර්යාලීය ගෘහ භාණ්ඩ | | 57,750.00 | |
| වි කිරීම් හා කාර්යාල උපකරණ | | 162,940.00 | |
| ාතික ඉතිරි,කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත් | | 178,000,000.00 | |
| යෝජන ලංකා බැංකුව | | 28,070,493.93 | |
| ාතික ඉතිරි කිරීමේ බැංකුවේ කැපකරු දායක වාපෘතිය යටතේ | | 38,700,000.00 | |
| ාතික ඉතිරි කිරීමේ බැංකුවේ සාමණේර ආයතන ව්‍යාපෘතිය | | 30,583,224.22 | |
| ාණ්ඩාගාර බිල්පත් ආයෝජනය (ලංකා බැංකුව) | | 86,066,406.70 | |
| හජන බැංකුවේ ස්ථාවර තැන්පත් | | 102,731,400.05 | |
| ාතික ඉතිරි කිරීමේ බැංකුවේ වෛද්‍යාධාර ව්‍යාපෘතිය | | 15,000,000.00 | |
| ාතික ඉතිරි කිරීමේ බැංකුවේ අංක 01125 ඉතිරි කිරීමේ ගිණුම | | 3,898,433.91 | |
| බ්ද විකාශන යන්ත්‍රය | | 45,885.00 | |
| ඩම් | | 7,000,000.00 | |
| නුරාධපුර ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් | | 3,500,000.00 | |
| ද්ධ ජයන්ති කාසි තොගය | | 317,400.00 | |
| විධ බෞද්ධ ග්‍රන්ථ | | 1,094,626.49 | |
| ාලි ටීකා සිංහල පරිවර්තන | | 5,010,401.11 | |
| 600 Years of Buddhism ග්‍රන්ථය | | 5,500,320.00 | |
| පාත් විකුණුම් පිරිවැය | | 1,290,702.38 | |
| ැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් පොත් | | 7,988,635.88 | |
| ාලි ටීකා ඉංග්‍රිසි පරිවර්ථනය සඳහා නැදිමාල බෞද්ධ | | 1,080,165.00 | |
| කුණුම් සඳහා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඇති පොත් | | 3,955,745.33 | |
| ැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලී | | 2,384,330.33 | |
| ැබිය යුතු ජාතික ඉතිරි කිරීමේ බැංකු පොලිය | | 8,415,434.94 | |
| ාමණේර කැපකරුපොලී ලැබීම් | | | 3,051,661.11 |
| ාමණේර ආයතන ව්‍යාපෘති ලැබිය යුතු පොලී | | 1,258,484.35 | |
| ා.ඉ.බැංකුව - වෛද්‍යාධාර ස්ථාවර තැන්පතු ලැබිය යුතු පොලී | | 479,178.08 | |
| හජන බැංකුවේ ස්ථාවර තැන්පත් ලැබිය යුතු පොලී | | 6,392,423.08 | |
| ාමණේර ආයතන පොලී ලැබීම් | | | 2,897,037.02 |
| ැබිය යුතු සමූපකාර අලෙවි සංවර්ධන සමිතියට ඉන්ධන සඳහා | | 0.00 | |
| ාජකීය ආසියාතික සංගමය | | 7,282.00 | |
| පාලී මත රඳවාගත් උපයනවිට ගෙවීම් බදු | | 656,427.96 | |
| හ බැංකුව | | 16,479,971.22 | |
| ංකාබැංකුව | | 672,936.96 | |
| ගවිය යුතු සාමණේර ආයතන දීමනා | | | 425,000.00 |
| ගවිය යුතු සාමණේර කැපකරු ශිෂ්‍යාධාර | | | 1,415,623.00 |
| ාලි ටීකා සඳහා නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථනයට | | | 544,409.50 |
| 600 Years of Buddhism පොත සඳහා ලිපි සැපයීම | | | 1,168,025.00 |
| නාමි ආධාර | | | 1,348,796.00 |
| ද්ධශාසන අරමුදල | | | 512,425,953.15 |
| ාතිකඉතිරි කිරීමේ ගිණුම් අංක 100011259873 පොලී | | | 203,573.56 |

| | | | |
|---|---|---|---|
| ජාතික ඉතිරි කිරීමේ ගිණුම් අංක 100010101125 පොලී | | | 141,027.34 |
| ජාතික ඉතිරි කිරීමේ ගිණුම් අංක 100011259873 | | 717,240.78 | |
| සාමණේර කැපකරු ශිෂ්‍යාධාර ගෙවීම් | | 4,454,026.50 | |
| සාමණේර ආයතන ගෙවීම් | | 1,015,000.00 | |
| භික්ෂු වෛද්‍යාධාර ගෙවීම් | | 260,800.00 | |
| සාමණේර ආයතන විභාග ගිණුම | | 8,350.00 | |
| කාර්යාලීය වැටුප් හා දීමනා | | 270,097.27 | |
| විධි දහම් පාසලට මුල්‍යාධාර | | 0.00 | |
| වැඩිහිටි භික්ෂු වැඩසටන් වියදම් | | 341,139.00 | |
| සනිපාරක්ෂක කටයුතු සඳහා මූල්‍යාධාර | | 2,100,000.00 | |
| ගොඩනැගිලි සමුච්චිත ක්ෂය | | | 262,500.00 |
| පෙස්ප්පුව සමුච්චිත ක්ෂය වෙන්කිරීම | | | 25,860.00 |
| ලී බඩු හා කාර්යාල උපකරණ සමුච්චිත ක්ෂය | | | 17,325.00 |
| ශබ්ද විකාශන යන්ත්‍ර සමුච්චිත ක්ෂය | | | 17,205.00 |
| සවි කිරීම් හා කාර්යාල උපකරණ ක්ෂය වෙන්කිරීම | | | 48,882.00 |
| ගොඩනැගිලි ක්ෂය | | 87,500.00 | |
| පෙස්ප්පුව ක්ෂය | | 4,310.00 | |
| ලී බඩු හා කාර්යාල උපකරණ ක්ෂය | | 5,775.00 | |
| ශබ්ද විකාශන යන්ත්‍ර ක්ෂය | | 5,735.00 | |
| සවි කිරීම් හා කාර්යාල උපකරණ ක්ෂය | | 16,294.00 | |
| ජා ඉ බැ සෘජු තැන්පත් පොලී | | | 14,455,307.03 |
| ලං බැ භාන්ඩාගාර බිල්පත් පොලී | | | 2,501,883.61 |
| ලංකාබැංකු පොලී | | | 2,149,639.26 |
| මහජනබැංකු පොලී | | | 8,103,298.32 |
| වෛද්‍ය ආධාර | | | 1,245,534.24 |
| පොත් අලෙවි ආදායම | | | 1,505,501.00 |
| පරිත්‍යාග | | | 14,472,266.18 |
| පරිත්‍යාග ලැබීම් | | | 5,297,972.18 |
| පරිත්‍යාග නිදහස් කිරීම | | 5,223,296.61 | |
| උඩු දුම්බර චෙක්පත් බෙදා දීමේ උත්සවය | | 138,000.00 | |
| සාමණේර ආයතන අධීක්ෂණ මණ්ඩල දීමනා | | 14,245.00 | |
| සංග්‍රහ වියදම් | | 15,980.00 | |
| ප්‍රවාහන වියදම් | | 67,566.00 | |
| ගමන් වියදම් | | 52,082.00 | |
| ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් | | 24,866.00 | |
| පරිගණක දීමනා | | 218,000.00 | |
| අතිකාල දීමනා | | 14,694.00 | |
| පාලක මණ්ඩල වියදම් | | 71,935.00 | |
| ජාතික ඉතිරිකිරීමේ කැපකරු ලැබියයුතු පොලී | | 621,698.63 | |
| ලංකාබැංකු ලැබියයුතු පොලී | | 1,117,193.79 | |
| | | 573,724,279.50 | 573,724,279.50 |

## බුද්ධශාසන අරමුදල

## 6.3 - 2016.12.31 දිනට ශේෂ පත්‍රය

| | සටහන | 2016 | 2015 |
|---|---|---|---|
| | | රු. ශ | රු. ශ |
| **වත්කම්** | | | |
| ස්ථාවර වත්කම් | 1 | 10,452,259.00 | 10,571,873.00 |
| ආයෝජන | 2 | 483,767,199.59 | 483,124,345.78 |
| ශුද්ධ ජංගම වත්කම් | 3 | 59,879,597.65 | 34,550,796.53 |
| | | **554,099,056.24** | **528,247,015.31** |
| **ඉන් නියෝජනය වන්නේ;** | | | |
| බුද්ධශාසන අරමුදල | | 538,277,994.06 | 512,425,953.13 |
| විවිධ පරිත්‍යාග | 4 | 14,472,266.18 | 14,472,266.18 |
| ස්වාමි ආධාර | | 1,348,796.00 | 1,348,796.00 |
| | | **554,099,056.24** | **528,247,015.31** |

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සකස් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම සඳහා බුද්ධශාසන අරමුදලේ ඉදිරියේ රැස්වනු ලබන පළමු පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.

බුද්ධ ශාසන අරමුදලේ 2016.12.31 දිනට ඉදිරිපත් කර ඇති ශේෂ පත්‍රය සහ ගිණුම් ප්‍රකාශන සම්බන්ධ වගකීම බුද්ධශාසන අරමුදලේ පාලක මණ්ඩලය සතු වන්නේය.

ජී.එන්. මුණසිංහ
ගණකාධිකාරී
බුද්ධශාසන අරමුදල

ගණකාධිකාරී,
බුද්ධශාසන අරමුදල
"දහම්පාය",
අංක 135,
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

ඩබ්.ටී.එච්. රුචිර විතාන
ලේකම්
බුද්ධශාසන අරමුදල

ඩබ්. ටී. එච්. රුචිර විතාන
අධ්‍යක්ෂ (පූජා භූමි හා බෞද්ධ කටයුතු)
බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය
"දහම්පාය"
නො. 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත
කොළඹ 07

දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන
ලේකම්
බුද්ධශාසන අමාත්‍යාංශය
බුද්ධශාසන අරමුදලේ
පාලකමණ්ඩල සභාපති

දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
අංක 135, "දහම්පාය",
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

ජී.බී. කරවිට
මහාභාරකාර තැන
බුද්ධශාසන අරමුදලේ
පාලකමණ්ඩල සාමාජික

ජී. බී. කරවිට (එල්එල්.බී)
නීතිඥ
මහා භාරකාර තැන (රා.ආ.)
මහා භාරකාර දෙපාර්තමේන්තුව

6.4 විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඑස්/ඩී/බීඑස්එෆ්/01/2016/එෆ් | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2021මාර්තු 10 දින

ලේකම්,

බුද්ධශාසන අරමුදල

බුද්ධශාසන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

බුද්ධශාසන අරමුදල
12 MAR 2021
BUDDASASANA FUND

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- 1. ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

2. ලේකම්, මුදල් අමාත්‍යාංශය

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | සීඑස්/ඩී/බීඑස්එෆ්/01/2016/එෆ් | ඔබේ අංකය / உமது இல. / Your No. |
| දිනය / திகதி / Date | 2021 මාර්තු 0 දින | |

ලේකම්,

බුද්ධශාසන අරමුදල

**බුද්ධශාසන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.**

---

බුද්ධශාසන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනතේ 12(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(**3**) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

ජාතික විගණන කාර්
தேசிய கணக்காய்வு அலுவ
NATIONAL AUDIT OFF
NAOSL

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

බැංකු තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වලට අදාල සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු.4,407,978 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් අයිතමයන් ඉදිරියෙන් දැක්වෙන සාක්ෂි ඉදිරිපත් කර නොමැතිවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | බෞද්ධ ධර්ම ග්‍රන්ථ | 11,605,348 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ii) | සුනාමි ආධාර | 1,348,796 | විස්තරාත්මක තොරතුරු |
| (iii) | අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු මුදල් | 13,031,848 | ශේෂ සනාථ කිරීම් සහ වයස් විශ්ලේෂණ |
| (iv) | ජංගම වගකීම් | 1,712,435 | ශේෂ සනාථ කිරීම් සහ වයස් විශ්ලේෂණ |
| (v) | ස්ථාවර වත්කම් | 10,452,259 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (vi) | වත්කම්ක්ෂය,විකුණුම් සහ ගෙවිය යුතු දීමනා ගිණුම්වලට අදාල මාරු කිරීම් | 3,630,939 | ජර්නල් සටහන් සහ ඊට අදාල වවුචර් |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 25,852,041ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.27,945,573 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,093,532 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ආයෝජන පොලී ආදායම ඇතුළුව මුළු අයභාරය රු.634,813 කින් වැඩිවුවත් වියදම රු.2,728,345 කින් වැඩිවීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු.35,038,436 ක් අරමුදලේ ආදායම් ලෙස ලැබී තිබුණ ද එයින් රු.9,186,395 ක් එනම් සියයට 26 ක් පමණක් අරමුදලේ අරමුණු වෙනුවෙන් වැයකර තිබුණි. තවද, වාර්ෂිකව අතිරික්ත වන මුදල් ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු ආයෝජන වටිනාකම රු.483,767,200 ක් විය. බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම අරභයා ඉතාමත් යෝග්‍ය කාර්යයන් සඳහා මුදල් යෙදවීම අරමුදලේ කාර්යභාරය වුවද, වාර්ෂිකව අරමුදලට ලැබෙන ආදායමට සරිලන අන්දමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

(ආ) අරමුදලට අයත් අනුරාධපුර බසවක්කුලම ප්‍රදේශයෙහි පිහිටි අක්කර 2 රූඩ් 01 පර්චස් 13 කින් යුතු ඉඩම හා එහි ඉදිකර ඇති ගොඩනැගිලි 1994 අගෝස්තු 15 දින සීමාසහිත ශ්‍රී අනුරාධපුර අමද්‍යපාන සංග්‍රහ සමිතිය වෙත රු.50 ක වාර්ෂික බදු කුලියකට බදු දී තිබුණි. බදු ගිවිසුමෙහි (ග) වගන්තිය ප්‍රකාරව බදු ගත් ඉඩම පිහිටි ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය විසින් කරනු ලබන වාර්ෂික ඉඩම් තක්සේරුවද අන් සාධක ද සලකා බලා බදු කුලිය ප්‍රතිශෝධනය කිරීමේ බලය බදු දීමනාකරුට ඇති අතර 2014 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව මෙම දේපළවල වෙළෙඳපොල වටිනාකම රු.10,500,000 ක් ලෙස දක්වා තිබුණ ද, බදු කුලිය ප්‍රතිශෝධනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

ජාතික විගණන කාර්යා
தேசிய கணக்காய்வு அலுவல
NATIONAL AUDIT OFFI
NAOSL

5. පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර අරමුදලේ ලේකම්වරයා දැනුවත් කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අරමුදල් ආයෝජනය හා උපයෝජනය

(ආ) ගිණුම්කරණය

(ඇ) අරමුණු අනුව කාර්යසාධන මට්ටම

(ඈ) අයවැය ලේඛනමය පාලනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති